සියළුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**මධ්‍ය වාර පරීක්ෂණය 2015**

**09 ශ්‍රේණිය**

# පෙරදිග සංගීතය

**කාලය පැය 2 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

**I කොටස**

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**
- **වඩාත් ම නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01 නිරිගරිස, පම්ගරිස යන මුඛ්‍යාංග ස්වර යෙදෙන රාගය වන්නේ,

(1) භීමපලාශ්‍රී (2) කාෆි (3) යමන් (4) භූපාලි

02 නි ස | ම ගු රි | ස - | ප නි ස මෙම සර්ගම් ගී පාදය අයත් වන රාගය ලෙස නම් කළ හැක්කේ,

(1) කාෆි (2) භූපාලි (3) යමන් (4) භීමපලාශ්‍රී

03 ඉහත සර්ගම් ගී පාදයට අදාළ හින්දුස්ථානි තාලය වන්නේ,

(1) දාදරා (2) දීප්චන්දි (3) ජප් තාලය (4) කෙහෙර්වා

04 භීමපලාශ්‍රී රාගයේ ආරෝහණයේ වර්ජිත ස්වර වන්නේ,

(1) ම, නි (2) රි, ධ (3) ග, නි (4) රි, ප

05 චන්දිභට්ටයින් විසින් ගයනු ලබන ගී විශේෂයකි.

(1) ප්‍රශස්ති (2) නූර්ති (3) කව්වාලි (4) නාඩගම්

06 තුල්සි දාස්, මීරා, බබීර් දාස්, සූර්දාස් වැන්නවුන් වඩාත් දායකත්වයක් ලබාදුන් ගායනා ශෛලිය වන්නේ,

(1) නූර්ති (2) ප්‍රශස්ති (3) කව්වාලි (4) භජන්

07 A සැළලිහිණි කොවුල් හඬ B රුවන් නිඳන හෙළ බිමයි

C රත්න දීප ජන්ම භූමි D දකුණ නැගෙනහිර බටහිර උතුරද

ඉහත ගී අතරින් දේශාභිමානි ගීතයක් නොවන්නේ,

(1) D (2) B (3) A (4) C

08 රටේ සතුරෙකුට සමාන කර ඇති රාග සම්බන්ධ අංගයකි

(1) වාදි (2) විවාදි (3) සංවාදි (4) අනුවාදි

09 හුනුවටය නාට්‍ය අයත් වන නාට්‍ය ශෛලිය වන්නේ,

(1) ශෛලිගත (2) අර්ධ ශෛලිගත

(3) තාත්වික (4) ලෝකධර්මී

10 මුස්ලිම් ආගමික නැඹුරුවක් ඇති ගීත විශේෂයකි

(1) භජන් (2) නූර්ති (3) කව්වාලි (4) ඛ්‍යාල්

- **පහත සඳහන් වගුව ඇසුරින් 11 - 15 දක්වා වූ ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

| | |
|---|---|
| 1. සිතාරය, තාම්පුරාව<br>සන්තූරය, එස්රාජය | 2. තබ්ලාව, පක්වාජ්<br>ඩෝලය |
| 3. ජල තරංග<br>ගෙජ්ජි | 4. බටනලාව, සර්පිනාව<br>ෂෙහනායි |

11 ඉහත භාණ්ඩ වර්ග හතර පිළිවෙලින් නම් කළ හැක්කේ

(1) අවනද්ධ, තත්, සුෂිර, ඝන (2) තත්. අවනද්ධ, ඝන, සුෂිර

(3) සුෂිර, ඝන, තත්, අවනද්ධ (4) තත්, ඝන, අවනද්ධ, සුෂිර

12 3 කොටසට අයත් භාණ්ඩ වර්ගය සඳහා දේශීය සංගීතයෙන් එක් කළ හැක්කේ,

(1) ගැටබෙරය (2) හොරණෑව (3) තාලම්පට (4) උඩැක්කිය

13 ස්වර වාදනය කිරීමට අපහසු භාණ්ඩ වර්ගය වන්නේ,

(1) 1 (2) 2 (3) 3 (4) 4

14 ගිටාරය, මැන්ඩලීනය, සැක්සපෝනය, බේස් ඩ්‍රම්ස් යන භාණ්ඩ වර්ග ආදේශ කළ හැකි භාණ්ඩ වර්ගයෙහි අංක පිළිවෙලින් සඳහන් කරන්න.

(1) 1, 3, 2, 4 (2) 1, 2, 3, 4 (3) 1, 2, 4, 3 (4) 1, 1, 4, 2

15 ඉහත සඳහන් ස්වර පුවරුවක් සහිත භාණ්ඩය අය් වන භාණ්ඩ වර්ගය

(1) 4 (2) 1 (3) 2 (4) 3

16 හින්දුස්ථානි රාග තාල යොදාගෙන ඇති ගායන ශෛලියක් නොවන්නේ,

(1) භජන් (2) නූර්ති (3) ප්‍රශස්ති (4) කව්වාලි

17 උදයට පායන හිරු දෙවියන්නේ - මෙම ගීතය ගායනයට සුදුසු තිත

(1) මැදුම් තනි තිත (2) මහ තනි තිත

(3) මැදුම් මහ දෙතිත (4) සුළු තනි තිත

18 රිගමගරි යන ස්වර අභ්‍යාසයේ ඊළඟ පියවර වන්නේ,

(1) ගමපමග (2) සරිගරිස (3) රිගධපග (4) ගමපරිම

19 කව්වාලි ගායන ශෛලියට අනුව වැඩි වශයෙන් ගීත ගායනා කළ ගායකයා වන්නේ,

(1) ඩබ්. ඩී. අමරදේව (2) ආර්. මුත්තුසාමි

(3) සුනිල් එදිරිසිංහ (4) මොහිදීන් බෙග්

20 කෝට්ටේ යුගයෙන් ආරම්භ වී මහනුවර යුගයේ ප්‍රචලිත වූයේ

(1) නාඩගම් ගීතයි. (2) වන්නම් (3) ප්‍රශස්ති (4) සේ ගී

(2 x 20 = 40)

ඉ-තක්සලාව The National e-learning Portal for The General Education

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.**

01 (1) භීමපලාශ්‍රී රාගයේ ආරෝහණ ස්වර ලියා දක්වන්න.

(2) ත්‍රිතාලයෙහි යෙදෙන තාල සංඥා ලියා දක්වන්න.

(3) වංග සංගීතය හා බැඳි හින්දුස්ථානි තත් වාද්‍ය භාණ්ඩය කුමක් ද?

(4) සිතාරයේ ප්‍රධාන තත හඳුන්වනු ලබන්නේ කුමන නමකින් ද?

(5) ජන ගී ආශ්‍රිතව නිර්මාණය වූ සරල ගීත 2 ක් නම් කරන්න.

(6) චාන්ටි, ලව, මෛදාන් වැනි කොටස් වලින් යුක්ත වාද්‍ය භාණ්ඩය කුමක් ද?

(7) සාමූහිකව ගායනා කළ හැකි ගැමි ගී විශේෂ 2 ක් ලියා දක්වන්න.

(8) දවුල යොදාගන්නා වාද්‍ය අවස්ථාවක් දක්වන්න.

(9) යමන් රාගයේ අනුවාදී ස්වර ලියා දක්වන්න.

(10) තීව්‍ර මධ්‍යම බටහිර සංගීතයට අනුව හඳුන්වනු ලබන්නේ කුමන නමකින් ද? (ල. 12)

02 (1) ඔබ උගත් සම්පූර්ණ ජාති රාගයක රාග විස්තරය ලියා දක්වන්න. (ආරෝහණ, අවරෝහණ. වාදි, සංවාදි, මුඛ්‍යාංගය) (ල. 04)

(2) යමන් රාගයේ ලක්ෂණ ගිතයේ ස්ථායි කොටස ගිත ස්වර ප්‍රස්තාර කරන්න.

• • (ල. 04)

(3) නිරිස නිරිගරිස ............ යන ස්වර අභ්‍යාස යමන් රාගයට අනුව ආරෝහණ අවරෝහණ වශයෙන් ගොඩනගන්න. (ල. 04)

03 (1) පහත සඳහන් හින්දුස්ථානි තාල තුනෙහි මාත්‍රා යෙදෙන ආකාරය දක්වා ඇත. එම තාල නම් කරන්න.

(a) 1 2 | 3 4 5 | 6 7 | 8 9 10

(b) 1 2 3 4 | 5 6 7 8 | 9 10 11 12 | 13 14 15 16

(c) 1 2 3 | 4 5 6 (ල. 06)

(2) ඉහත (b) කොටසට අයත් තාලය ප්‍රස්තාර කරන්න. (ල. 03)

04 (1) ම, ප ශ්‍රැති කරගෙන කාෆි රාගයේ ආරෝහණ, අවරෝහණ ස්වර ලියන්න. (ල. 04)

(2) පහත සඳහන් ස්වර ස්ථාපන ගීතය මධ්‍යම භාවයෙන් හා පාංචම භාවයෙන් ලියා දක්වන්න. (ල. 08)

| | | | |
|---|---|---|---|
| ස රි රි රි | ග - ම - | ස රි ග ම | ප ධ ප - |
| ප ධ ම ප | ග ම රි ග | ස රි ග ම | ග රි ස - |
| ස රි ග ම | රි ග ම ප | ග ම ප ධ | නි - ස - |
| ස̇ නි ධ ප | නි ධ ප ම | ධ ප ම ග | රි රි ස̇ - |

(3) c කොටසට අයත් තාලයට සමාන දේශීය තිත නම් කර එම තාලය ප්‍රස්තාර කරන්න. (ල. 03)

05 (1) දේශීය භාණ්ඩ වර්ගීකරණය ලියා දක්වා ඒවා නිදසුන් මගින් පැහැදිලි කරන්න. (ල. 04)

(2) උඩරට ප්‍රදේශයට ආවේණික වාද්‍ය භාණ්ඩයක් ඇඳ කොටස් නම් කරන්න. (ල. 04)

(3) ( සිතාරය, තබ්ලාව, ෂෙහනායි, එස්රාජ්, ජල තරංග, සරෝද්, බටනලාව, පක්වාජය, ගෙජ්ජි )

ඉහත භාණ්ඩ ලැයිස්තුව උපයෝගී කරගෙන පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න. (ල. 04)

| හඬ නිපදවන ආකාරය | භාණ්ඩය | භාණ්ඩ වර්ගය | කාර්යය |
|---|---|---|---|
| තත් ආධාරයෙන් | | | |
| සුළඟේ ආධාරයෙන් | | | |
| ලෝහයෙන් හා ඝන ද්‍රව්‍යයක් ගැටීමේ ආධාරයෙන් | | | |
| සම් ආධාරයෙන් | | | |

The National e-learning Portal for The General Education